# ඔබේ පරිගණකය ආරක්ෂා කර දෙන මිතුරා

# නෝටන් සිස්ටම් වර්ක්

# NORTON SYSTEM WORK

**ඔබ අලුත මිලදී ගත් පරිගණකය ටික දිනකින් ලෙඩ දෙනවා නම්, නිතරම එය මිලදී ගත් ආයතනයට රැගෙන යාමට සිදුවේ නම් මොහොතක් නවතින්න. එයට පහසු විසඳුමක් ඇත.**


මෙය තවත් එක් මෘදුකාංගයක් පමණක්ම නොවේ. වෛරස් නාශක වැඩ සටහනක් ද, මෙහෙයුම් පද්ධතියේ හා දෘඩ තැටියේ දෝෂ නිරාකරණය කිරීමේ වැඩ සටහන් වලින් ද සමන්විත වන නිසා මෙය පරිපූර්ණ දෝෂ නිරාකරණය කිරීමේ මෘදුකාංගයක් වශයෙන් හැඳින්වීමට පුළුවන.

ඒ නෝටන් සිස්ටම් වර්ක් (Norton System Work) නැමැති මෘදුකාංගයයි. ඔබේ බොහෝ ගැටළු වලට විසඳුම් මෙම මෘදුකාංගය තුළ තිබීමට බැරි නැත.


මෙය තවත් එක් මෘදුකාංගයක් පමණක්ම නොවේ. වෛරස් නාශක වැඩ සටහනක් ද, මෙහෙයුම් පද්ධතියේ හා දෘඩ තැටියේ දෝෂ නිරාකරණය කිරීමේ වැඩ සටහන් වලින් ද සමන්විත වන නිසා මෙය පරිපූර්ණ දෝෂ නිරාකරණය කිරීමේ මෘදුකාංගයක් වශයෙන් හැඳින්වීමට පුළුවන. මෙම මෘදුකාංගය සෑම වසරක් පාසාම සංස්කරණය කරනු ලබයි. ඔබට අවශ්‍ය නම් මෙහි නවතම සංස්කරණය ද අන්තර් ජාලය හරහා ලබාගත හැකිය. මෙහි 2003 හා 2004 වර්ෂවල සංස්කරණයන් ඔබේ පරිගණකයට ඇතුළු කිරීම සඳහා අවම වශයෙන් "Internet Explorer 5.5" සංස්කරණයවත් ඔබේ පරිගණකයේ තිබිය යුතු වේ. Windows Me, 2000 හා XP මෙහෙයුම් පද්ධති සඳහා මෙය බල නොපාන මුත්, Windows 98 හි ඇත්තේ පැරණි සංස්කරණයක් නිසා නව සංස්කරණය අන්තර් ජාලය හරහා පිහිටුවා ගත යුතුයි.

නෝටන් සිස්ටම් වර්ක් ඔබේ පරිගණකයේ පිහිටුවූ පසු තිරයෙහි දකුණු රෝදයක සටහන් සහිත "අයිකනයක්" දිස්වේ. මෙම "අයිකනය" සක්‍රිය කළ පසු මෙහි මුල් පිටුව (Home Page) දිස්වේ. මෙහි පහතින් ඇති "Begin Oheckup" නැමති බොත්තම සක්‍රිය කරන්න. එවිට (1) රූපයේ මෙන් මුහුණතක් දිස්වේ. එහි දී පරිගණකයේ ඇති විවිධ දෝෂයන් සොයා බලනු ලබයි. දෝෂ කොපමණ සංඛ්‍යාවක් තිබේ ද යන්නත් ඒ පිළිබඳව විස්තරයකුත් ඔබට බලාගත හැකියි. පහතින් ඇති "Begin Fix" නැමති බොත්තම සක්‍රිය කිරීමෙන් එම දෝෂයන් ස්වංක්‍රීයව නිරාකරණය කරනු ලබයි. මෙම උපයෝගිතාව සතියකට වරක්වත් කිරීමෙන් ඔබට ඔබේ පරිගණකය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබෙනු ඇත.


මෙහි වම් පස ඇති බොත්තම් කීපයෙන් ඉහත කී කාර්යයන් විශේෂාංගයන් සහිතව වඩාත් හොඳින් ක්‍රියාත්මක කළ හැකියි. මෙම ලිපියේ පෙන්වා දී ඇති ජායාරූපවල ඇත්තේ 2003 වර්ෂයේ සංස්කරණය "Windows Xp" මෙහෙයුම් පද්ධතිය සමග ක්‍රියාත්මක වීමේ දී ලබාගත් ජායාරූපයි. Windows 98 හා අනෙකුත් මෙහෙයුම් පද්ධතිවලදී මීට තරමක් වෙනස් ආකාරයෙන් මෙම මෘදුකාංගය ක්‍රියාත්මක වන බව මතක තබා ගන්න.





1




2




මෙහි මුල් පිටුවේ (Home Page) වම් පස ඇති බොත්තම් කීපයෙන් කෙරෙන කාර්යයන් දෙස අවධානය යොමු කරමු. (7) රූපයෙන් පෙන්වා ඇත්තේ "Norton utilities" නැමති බොත්තම ක්‍රියාත්මක කළ පසු දිස්වන අතුරු මුහුණතෙහි ඇති "Optimize" නැමති බොත්තම සක්‍රිය කළ පසු දිස්වන අන්දමයි. එහි ඇති "Speed Disk" බොත්තම සක්‍රිය කළ විට පරිගණකයේ දෘඩ තැටිය කොටස් වලට බෙදා ඇත්නම් එම කොටස් ද එක් එක් කොටසේ තැම්පත් වී ඇති ගොනු හා දත්තවල ප්‍රමාණයන් අළු පැහැයෙන් ද, හිස් ඉඩකඩ සුදු පැහැයෙන් ද දිස්වේ. (6 රූපය).


බොහෝ විට දක්නට ලැබෙනුයේ තැනින් තැන විසිරුනු අළු පැහැති කොටස්ය. මෙයින් හැඟෙනුයේ ගොනු හා දත්ත අක්‍රමවත්ව දෘඩ තැටියේ ගබඩා වී ඇති බවයි. මෙවැනි අක්‍රමවත් ලෙස විසුරුණු දත්ත හා ගොනු ඇති පරිගණකයකින් දත්ත ලබා ගැනීමේ දී යම් කාලයක් ලබා ගන්නා නිසා පරිගණකය මන්දගාමී ලෙස හැසිරෙනවා යැයි ඔබ සිතන්නේ මේ නිසාය. මෙලෙස විසිරී ඇති ගොනු හා දත්ත ක්‍රමවත් ලෙස නියමිත ප්‍රමිතියකට යටත්ව නැවත ගබඩා කිරීමකුයි මෙම උපයෝගිතාවෙන් කෙරෙනුයේ.

මෙය ක්‍රියාත්මක කර මොහොතක් එදෙස බලා සිටින්න. විසිරී ඇති ගොනු ක්‍රම ක්‍රමයෙන් එකතු වන හැටි බලන්න. මෙසේ ගොනු එක් වූ පසු (සමහර විට දෘඩ තැටියේ ප්‍රමාණය අනුව පැයකට වඩා ගතවීමට පුළුවන.) ඊළඟ කාණ්ඩය ද එලෙසම "Optimize" කරන්න. මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට පෙර "Screen Saver" එක අක්‍රිය කිරීමට මතක තබා ගන්න. මෙසේ "Optimize" කළ පසු පරිගණකයෙහි වේගය වැඩි වූ බව ඔබට දැනේවි.

දෘඩ තැටියෙහි ඇති භෞතික දෝෂයන් සොයා එය නැවත ප්‍රතිසංස්කරණය කිරීමට මෙහි ඇති "Disk Doctor" උපයෝගී කර ගනී. මෙය මෙහෙයුම් පද්ධතියේ ඇති "Scan Disk" වැඩ සටහනට සමාන මුත් ඊටත් වඩා වැඩි විශේෂාංගයන්ගෙන් සමන්විත වේ. මෙය සක්‍රිය කළ පසු 3 රූපයේ පරිදි අතුරු මුහුණතක් දිස්වේ. යම් දෝෂයක් ස්වයංක්‍රියව නිරාකරණය කිරීමට අවශ්‍ය නම් වම් පස පහත ඇති "Fix Error" නැමති කොටස සක්‍රීය කළ යුතු වේ. මෙහි ඇති "Options" බොත්තම තුළ ඇති Surface Test" කොටුව සක්‍රිය වී ඇති විට දෘඩ තැටිය සියුම් ලෙස පරීක්ෂා කරනු ලැබේ. මේ සඳහා සෑහෙන කාලයක් ගතවෙන බැවින් මුල් වරට ක්‍රියාත්මක කළ පසු මෙය අක්‍රීය කිරීමට වග බලාගන්න. අවශ්‍ය නම් පමණක් "Surface Test" සක්‍රිය කරන්න.

මෙහෙයුම් පද්ධතියේ ඇති දෝෂයන් නිවැරදි කිරීමට "Win Doctor" උපයෝගී කර ගනී. (5 රූපය) මෙය ක්‍රියාත්මක කළ පසු එහි වැරදි තිබේ නම් ඒ බව දන්වා නිවැරදි කළ යුතු දැයි අසයි. ඒ සඳහා අනුමැතිය දුනහොත් ස්වයංක්‍රියව එම දෝෂ නිවැරදි කරනු ලබයි.

මෙම "System Work" තුළ ඇති වැදගත්ම උපයෝගීතාව නම් "Anti Virus" වැඩ සටහනයි.









ඔබේ පරිගණකයට මොන යම් අයුරකින් හෝ ඇතුළු වන වෛරස් ක්ෂණිකවම හඳුනාගෙන ඒවා විනාශ කිරීමට මෙයට හැකියි. (7 රූපය)

දෘඩ තැටියේ ඇති භාවිතයට නොගන්නා අනවශ්‍ය ගොනු පහසුවෙන් ඉවත් කිරීමට "Clean Sweep" (8 රූපය) මගින් කළ හැකියි.


පරිගණකයෙහි ඇති වැදගත් ගොනුවක් ඔබ අතින් වැරදීමකින්




7




8




9

මකා දැමුනොත් එය නැවත ලබා ගත හැක්කේ "bin" එකෙන්ම පමණයි.

නමුත් එයින් ද එය ඉවත්කර ඇත්නම් නැවත කිසිදක එම ගොනු නැවත ලබා ගැනීමට නොහැකිවේ. මෙම මෘදුකාංගයෙහි ඇති "Un Erase Wizard" මගින් එසේ ඉවත් කළ බොහෝ ගොනු නැවත ලබා ගැනීමට හැකියාව ලැබේ. (9 රූපය) මෙහි දී එම ගොනු සෙවීම සඳහා විකල්ප කීපයක් ද ඇති නිසා ඒවා අත්හදා බලන්න.

පරිගණකය පණ ගැන්වීමේ දී "Norton System Doctor" නැමැති වැඩ සටහන නිතැතින්ම දියත් වේ. මෙහිදී පරිගණකයෙහි ඇති දෝෂයන් සොයා වාර්තා කරන නිසා ඒ සඳහා යම් කාලයක් ගනු ලබනවා.

මෙය පරිගණකයෙහි ආරම්භය මන්දගාමී කරනු ලබනවා. මෙය ආරම්භයේදී දියත්වීම අහෝසි කිරීම මෙන්ම පරිගණකය පණ ගැන්වීමේ දී දියත් කළ යුතු උපයෝගිතාවන් සැකසීම සඳහා "Norton System Work" හි "Home Page" වෙත ගොස් "Option" හි ඇති "Start up" හි 'අයිකනය' සක්‍රිය හෝ අක්‍රිය කරන්න. නමුත් "Anti Virus" අක්‍රිය කිරීමෙන් වළකින්න. මන්ද යත් පරිගණකය වෛරස් පිළිබඳව නිරන්තරයෙන්ම අවදියෙන් සිටිය යුතු නිසයි. මෙහි ඉහත සඳහන් කළේ මෙහි ඇති වැදගත් වේ යැයි සිතූ උපයෝගිතාවන් කීපයක් පමණයි. ඔබත් ඔබේ පරිගණකයට මෙම මෘදුකාංගය ඇතුළත් කර ක්‍රියාත්මක කර බලන්න. එවිට මෙතෙක් මන්දගාමීව විවිධ දෝෂ පණිවුඩ වලින් ගහණ වූ ඔබේ පරිගණකය කාර්යක්ෂමව වැඩ කරන අයුරු දැක ගත හැකියි. ❑

**මොහාන්**